259947

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

5

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, 2020

**පාසල්වලට සිසුන් තෝරාගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2020**

# I පත්‍රය

**පැය එකයි.**

**විභාග අංකය** ......................................

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්:**

* ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත ලියන්න.**
* **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **40**ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු **තුන** බැගින් දී ඇත. ඒවා අතුරෙන්, එක් එක් ප්‍රශ්නයට අදාළ **නිවැරදි පිළිතුර තෝරාගෙන රව යටින් ඉරක් අඳින්න.**
* කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව ඉලක්කමෙන් | |
| එකතුව අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමුවන පරීක්ෂක** ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක** පළමුවන පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක** ඇගයීම කර, ප්‍රදානය කළ ලකුණු සහ එකතුව නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක** අධීක්ෂණය කළෙමි. එකතුව නිවැරදි ය. | V/I/S/CH |

[දෙවැනි පිටුව බලන්න.

- පහත ඇති රූප නිරීක්ෂණය කර අංක **1** සහ **2** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**1.** කොටුව තුළ ඇති චිත්‍රයට වඩාත් සමාන වන සේ ඇඳ ඇති චිත්‍රය කුමක් ද?



(1) 

(2) 

(3) 

**2.** A රූපයට සමාන රූපයක් ලබා ගැනීම සඳහා B රූපයේ සිදු කළ යුතු වෙනස්කම් ගණන කීය ද?



A රූපය



B රූපය

(1) 2 (2) 3 (3) 5

- අංක **3** සහ **4** ප්‍රශ්නවල, කොටුව තුළ ඇති කාණ්ඩයට ඇතුළත් කිරීමට වඩාත් ගැළපෙන රූපය කුමක් ද?

**3.**



(1) 

(2) 

(3) 

**4.**



(1) 

(2) 

(3) 

**5.** මෙම රූපය නිවැරදිව සම්පූර්ණ කිරීමට කුමන රූප කැබැල්ල සම්බන්ධ කළ යුතු ද?



(1) 

(2) 

(3) 

[තුන්වැනි පිටුව බලන්න.

259947



විභාග අංකය :................................

**6.** කොටුව තුළ ඇති රූප බලන්න.



එම රූප කැබලි තුන ම එකතු කර සැකසිය හැකි තනි රූපය කුමක් ද?



(1) (2) (3)

**7.** රූපවලින් දක්වා ඇති අවස්ථා තුන අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක් ද?




(1) A, B, C (2) A, C, B (3) C, A, B

**8.** 

හිස් කොටුවට වඩාත් ගැළපෙන රූපය තෝරන්න.

(1)  (2)  (3) 

**9.** කොටුව තුළ ඇති රූප පේළියේ ඊළඟට යෙදිය යුතු රූපය කුමක් ද?





(1) (2) (3)

**10.** 


මෙම කාඩ්පත් හතර ඒවායේ ඇති රෝම ඉලක්කම්වල ආරෝහණ පටිපාටිය අනුව තැබූ විට රූප පිහිටන අනුපිළිවෙළ කුමක් ද?

(1)  (2)  (3) 

**11.** දී ඇති රටාවෙහි හිස්කොටුවට ගැළපෙන පිළිතුර කුමක් ද?



(1)  (2)  (3) 

**12.** 966,999 හා 39765 යන සංඛ්‍යා හරහටත් 389 හා 796 යන සංඛ්‍යා පහළටත් ලැබෙන පරිදි කොටුදැල සම්පූර්ණ කළ විට එහි හතරවන තීරයේ පහළට ලැබෙන සංඛ්‍යාව කුමක් ද?



(1) 59 (2) 66 (3) 69

**13.** පහත දී ඇති රූප දෙක විනිවිද පෙනෙන කඩදාසි දෙකක ඇඳ ඇත.



1 රූපය



2 රූපය

රූප දෙකෙහිම C සලකුණු එක මත එක පිහිටන සේ එක් කඩදාසියක් මත අනෙක තැබූ විට ලැබෙන රූපය කුමක් ද?

(1)  (2)  (3) 

**14.** දින 31 ක් ඇති එක්තරා මාසයක පළමුවැනිදා සඳුදා දවසකි. එම මාසයේ 31 වැනිදා,

(1) අඟහරුවාදා දවසකි. (2) බදාදා දවසකි. (3) බ්‍රහස්පතින්දා දවසකි.

**15.** සේන, උදෑසන 6.00 සිට දහවල් 12.00 තෙක් ද පාල එතැන් සිට සවස 5.00 තෙක් ද දයා එතැන් සිට රාත්‍රි 8.00 තෙක් ද වැඩක නිරත වූහ. ඔවුන් තිදෙනා එම වැඩෙහි නිරත වූ කාලය ප්‍රමාණාත්මකව දක්වා ඇති පිළිතුර කුමක් ද?

(1) 


(2) 


(3) 

**16.** පහත රූපයේ තිබෙන ත්‍රිකෝණ සංඛ්‍යාව කීය ද?



(1) 5 (2) 6 (3) 7

**17.**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1 | 3 | 7 | 4 | 5 | 2 | 6 |

මෙහි දැක්වෙන ඉලක්කම් හත ආරෝහණ පටිපාටියට සැකසීම සඳහා ඉලක්කම් කීයක පිහිටීම් වෙනස් කළ යුතු ද?

(1) 3 (2) 4 (3) 5

**18.**

| | | | |
|---|---|---|---|
| 1 | 2 | 3 | 6 |
| 3 | 6 | 12 | 3 |
| 4 | 8 | | 5 |
| 3 | 1 | 5 | 5 |

මෙම රූපයේ ඇති හිස් කොටුවට ගැළපෙන සංඛ්‍යාව කුමක් ද?

(1) 14 (2) 15 (3) 16

**19.** පහත රූපයෙහි ඇති හිස් කොටස පිරවීමට සුදුසු කොටස් අයත් පිළිතුර කුමක් ද?



(1) 

(2) 

(3) 

**20.** අංක 01, 02 ආදී වශයෙන් 50 තෙක් අංක ලිවීමේදී 0 ඉලක්කම යෙදෙන වාර ගණන කීය ද?

(1) 7 (2) 13 (3) 14

**21.** පන්ති තුනක සිටින ශිෂ්‍ය සංඛ්‍යා 36, 37 සහ 38 වේ. ඉන් එක් පන්තියක පිරිමි ළමයින් සංඛ්‍යාවට වඩා ගැහැනු ළමයි තුන්දෙනෙක් වැඩියෙන් සිටිති. එම පන්තියේ සිටින ශිෂ්‍ය සංඛ්‍යාව කීය ද?

(1) 36 (2) 37 (3) 38

**22.** පහත ඇති කවියෙන් කියවෙන්නේ කුමක් පිළිබඳව ද?

සීමා දැනගෙන එහෙ මෙහෙ යන්නේ
සතුටෙදි දුකේදි නිතර තෙමෙන්නේ
අනතුරකට නම් නෑ ඉඩ දෙන්නේ
දොරටු දෙකෙන් ඉක්මනට වැසෙන්නේ

(1) ඇස (2) මුඛය (3) නාසය

**23.** I රූපයෙහි අඳුරු කර ඇති කොටු පමණක් වැසෙන සේ II රූපය ඇලවූවහොත්, එවිට ලැබෙන සමචතුරස්‍ර කොටුදැලෙහි ඇති මුළු කොටු සංඛ්‍යාව කීය ද?

(1) 16
(2) 25
(3) 36




**24.** 

සමචතුරස්‍ර තහඩුවක මුලු හතරෙන්, රූපයේ අඳුරු කර දැක්වෙන පරිදි, කුඩා සමචතුරස්‍ර කොටස් හතරක් කපා ඉවත් කරනු ලැබේ. එවිට ඉතිරි වන කොටසේ වටේ දිග, මුලින් තිබූ තහඩුවේ වටේ දිගට,

(1) වඩා අඩු ය.  (2) සමාන ය.  (3) වඩා වැඩි ය.

**25.** 


මෙම රූපයේ ඇති දැතිරෝද දෙක, ඊතල මගින් දැක්වෙන පරිදි කැරකීමේදී එකිනෙක ස්පර්ශ වන කොටස් දෙකක ඇති ඉලක්කම සහ රූපය නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) 2 සහ △
(2) 4 සහ ▨
(3) 6 සහ ▨

**26.** කඩදාසි පාර්සලයක් තදව සිටින සේ එය වටා රබර් පටියක් යොදා ඇති අයුරු රූපයේ දැක්වේ. එවිට රබර් පටිය, එහි මුල් දිග මෙන් දෙගුණයක් වන සේ ඇදී පවතී. පාර්සලයේ මිනුම් රූපයේ දී ඇත. රබර් පටියේ මුල් දිග කොපමණ ද?

(1) 12.5 cm  (2) 25 cm  (3) 50 cm




**27.** පහත ඇති සටහන බලන්න.




හිස් කොටුව සඳහා ගැළපෙන රූපය කුමක් ද?

(1)   (2)   (3) 

**28.** පන්තියක සිටි පිරිමි ළමයි හා ගැහැනු ළමයි මාරුවෙන් මාරුවට සිටින සේ පේළියක සිටියහ. පේළියේ මුලින් ම සිටියේ පිරිමි ළමයෙකි. නමුත් පේළිය අවසානයේ එක ළඟ ගැහැනු ළමයින් හතරදෙනකුට සිටීමට සිදු විය. පන්තියේ සිටි මුළු ළමයින් ගණන 45කි. එහි සිටි පිරිමි ළමයින් ගණන කීය ද?

(1) 20  (2) 21  (3) 22

[හත්වැනි පිටුව බලන්න.

**29.** දී ඇති කොටුදැලෙහි ආරම්භක කොටුවේ සිට අවසාන කොටුව තෙක් කොටුදැල තුළින් යා යුත්තේ අඳුරු කර ඇති කොටු මගහරිමිනි. කෙටිම මාර්ගයෙන් එසේ යාමේදී අතරමග කොටු කීයක් පසු කිරීමට සිදු වේ ද?

(1) 11
(2) 13
(3) 15




**30.** A රූපයේ දැක්වෙන හැඩයේ කඩදාසියක් කඩඉර දිගේ නමා B රූපයේ දැක්වෙන හැඩය ලබාගෙන, එහි දැක්වෙන කඩඉර දිගේ කපා කැබැලි කරන ලදී. ලැබුණු ත්‍රිකෝණාකාර කැබලි සංඛ්‍යාව කීය ද?


A රූපය


B රූපය

(1) 2 (2) 3 (3) 4

**31.** 

වන විට,  හි හිස් කොටුවට ගැළපෙන සංඛ්‍යාව කුමක් ද?

(1) 7 (2) 8 (3) 9

**32.** රාධා, සීතා, මීනා, කාසිම් සහ සුනිල් යන පස්දෙනා අතුරෙන්, රාධාට වඩා වයසින් බාල තිදෙනකු පමණි. කාසිම්ට වඩා වයසින් බාල දෙදෙනකු පමණි. සීතාට වඩා වයසින් බාල සුනිල් පමණි. වැඩිමහල්ම කවුරුන් ද?

(1) මීනා (2) රාධා (3) කාසිම්

**33.** 

රූපයේ දැක්වෙන්නේ සමාන ලී කුට්ටි සමූහයක් යොදාගෙන කර ඇති ගොඩනැගීමකි. ලොකු හරි හතරැස් ලී කුට්ටියක් ලැබෙන පරිදි මෙම ගොඩනැගීම සම්පූර්ණ කිරීමට තව කුඩා ලී කුට්ටි කීයක් අවශ්‍ය වේ ද?

(1) 5
(2) 8
(3) 9

**34.** මීටර සියය දිවීමේ තරගයක් පිළිබඳව A, B සහ C යනුවෙන් ප්‍රකාශ තුනක් පහත දී ඇත.

A : බිමල්ට පෙර අමල් තරගය නිම කළේ ය.
B : තරගකරුවන් හය දෙනකු තරගය නිම කළේ බිමල්ට පසුව ය.
C : තරගකරුවන් අට දෙනෙක් තරගයට සහභාගි වූහ.

තරගයේ පළමුවැන්නා කවුරුන්දැයි නිගමනය කිරීමට අවශ්‍ය ප්‍රකාශ මොනවා ද?

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) A, B හා C තුනම.

[අටවැනි පිටුව බලන්න.

● රූපයෙහි දැක්වෙන්නේ පාපැදිකරුවකු ආරම්භක ස්ථානයෙන් ගමන් අරඹා නැවත එම ස්ථානයට පැමිණි මාර්ගයයි. එය ඇසුරෙන් අංක **35** සහ **36** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




**35.** ආරම්භක ස්ථානයට පාපැදිකරු නැවත පැමිණෙන විට දකුණුපසට හා වම්පසට හැරුණු වාර ගණන කීය ද?

(1) දකුණුපසට 1යි, වම්පසට 5යි
(2) දකුණුපසට 4යි, වම්පසට 1යි
(3) දකුණුපසට 5යි, වම්පසට 1යි

**36.** නැවත ආරම්භක ස්ථානයට පැමිණෙන විට පාපැදිකරු ගමන් කර ඇති මුළු දුර කිලෝමීටර කීය ද?

(1) 24 (2) 29 (3) 32

**37.** අමර, කමල් හා සමන් යන මිතුරන් තිදෙනාගේ නැඟණියෝ දීපා, රාණි හා සීතා වෙති. අමරගේ නැඟණිය වාඩි වී සිටින්නේ දීපා සමඟයි. කමල්ගේ නැඟණිය දීපා නොවේ නම්, සමන්ගේ නැඟණිය කවුරුන් ද?

(1) දීපා (2) රාණි (3) සීතා

**38.** A හා B භාජනවල ඇති සහල්වලින් හරි අඩක් බැගින් ඉවතට ගෙන ඒවා එම භාජන දෙකට මාරු කර දමනු ලැබේ. එවිට A භාජනයේ ඇති සහල් ප්‍රමාණය, B භාජනයේ ඇති සහල් ප්‍රමාණයට,




(1) වඩා අඩු වේ.
(2) සමාන වේ.
(3) වඩා වැඩි වේ.

**39.** රාජා ළඟ තිබූ මුදලට වඩා රුපියල් 25ක් වැඩියෙන් ආශා ළඟ තිබුණි. ආශා රුපියල් 15ක් රාජාට දුන් විට, රාජා ළඟ ඇති මුදල ආශා ළඟ ඇති මුදලට වඩා,

(1) රුපියල් පහක් වැඩි ය.
(2) රුපියල් දහයක් වැඩි ය.
(3) රුපියල් දහයක් අඩු ය.

**40.** රූපයේ දැක්වෙන්නේ වෘත්තාකාර ධාවන පථයකි. ළමයි දෙදෙනෙක් එහි A නමැති ස්ථානයෙන් එකවිට පිටත් වී එකම දෙසට ගමන් කරති. එක් ළමයකුගේ වේගය, අනෙක් ළමයාගේ වේගය මෙන් දෙගුණයක් නම්, ඔවුන් දෙදෙනා නැවත මුණගැසෙන ස්ථානය කුමක් ද?

(1) A
(2) B
(3) C




***